**18-12-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, අසීමිත පියා ඔබව ඥානයෙන් සැරසවීමට පැමිණ සිටියි. ඔබට උසස් තත්ත්වයක් හිමි කරගැනීමට අවශ්‍ය නම්, නිරතුරුවම සැරසී සිටින්න.

**ප්‍රශ්නය:** අසීමිත පියා බොහෝ සතුටට පත්වන්නේ කුමන දරුවන් දැකීමෙන්ද?

**පිළිතුර:** සේවය සඳහා සෑම විටෙකම නිති සූදානමින් සිටින, සම්පූර්ණයෙන්ම අලෞකික මෙන්ම පාරලෞකික පියවරුන්ව අනුගමනය කරන, එමෙන්ම තම ජීවාත්ම, ඥානයෙන් සහ යෝගාවෙන් සරසාගන්නා සහ අපවිත්‍ර අයව පිවිතුරු කිරීමට, ඔවුන්ට සේවය කරන දරුවන් දැකීමට, අසීමිත පියා බොහෝ සතුටු වෙයි. පියාගේ ආශාව වන්නේ, දරුවන් උත්සාහ දරා උසස් තත්ත්වයක් හිමි කරගැනීමය.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා, ආධ්‍යාත්මික දරුවන්ට පවසන්නේ : සුමිහිරිතම දරුවනි, භෞතික පියෙක් තම දරුවන්ට ආදරය කරන ආකාරයෙන්ම, අසීමිත පියාද ඔහුගේ අසීමිත දරුවන්ට ආදරය කරයි. පියෙක් තම දරුවන්ට උගන්වන අතර, ඔවුන්ට උසස් තත්ත්වයක් හිමි කරගැනීමට විපරමින් සිටින ලෙසද පවසයි. පියෙකුගේ ආශාව එයයි. අසීමිත පියාගේ ආශාව වන්නේද එයමයි. ඔහු ඔය දරුවන්ව ඥානය සහ යෝගාවේ ආභරණ වලින් සරසවයි. ඔබට උසස් තත්ත්වයක් හිමි කරගැනීම සඳහා පියවරුන් දෙදෙනාම ඔබව හොඳින් සරසවයි. අලෞකික පියා සතුටු වන අතර, පාරලෞකික පියාද සතුටු වෙයි. ඉතා හොඳින් උත්සාහ දරන අය ගැන සිහි කර තිබෙන්නේ, ඔවුන් පියාව අනුගමනය කරන අය ලෙසින්ය. එබැවින් ඔබ ඔවුන් දෙදෙනාවම අනුගමනය කළ යුතුයි. එක් අයෙක් ආධ්‍යාත්මික පියා වන අතර අනෙක් කෙනා අලෞකික පියාය. එබැවින් ඔබ උසස් තත්ත්වයක් හිමි කරගැනීමට උත්සාහ දැරිය යුතුයි. ඔබ බත්තියක සිටි විට, ඔබගේ කිරුළු සමග ඔබ සෑම කෙනෙකුගේම පිංතූරයක් ගන්නා ලදී. ආලෝකයේ කිරුළක් නොමැති බව, පරම පියා විස්තර කර ඇත. එය සෑම කෙනෙකුටම ලබා දෙන පාරිශ ශුද්ධත්වයේ සංකේතයක් පමණයි. සැබවින්ම සුදු ආලෝකමත් කිරුළක් නොමැත. එය පාරිශ ශුද්ධත්වයේ සංකේතයක් ලෙස පෙන්වා තිබේ. මුලදී ඔබ ජීවත් වන්නේ ස්වර්ණමය යුගයේය. එහි සිටින්නේ ඔබ පමණයි. පරමාත්ම පියා මෙසේද පවසයි ජීවාත්ම, බොහෝ කාලයක් පරමාත්ම ජීවයගෙන් වෙන්ව සිටියා. පළමුව පැමිණෙන අය වන්නේ ඔබ වන අතර, ඉන්පසුව පළමුව ආපසු යා යුත්තේද ඔබයි. ඔබ විමුක්ති දේශයේ දොරටු විවර කළ යුතුයි. පියා ඔය දරුවන්ව සරසවනවා. මාපිය නිවසෙහිදී, කෙනෙක් ජීවත් වන්නේ වාම්වටයි. මෙකල ඔබද බොහෝ සාමාන්‍ය ලෙසින් සිටිය යුතුයි වැඩිපුර උසස්ද, වැඩිපුර පහත්ද නොවී. පරම පියා පවසන්නේ මා ඇතුළු වන්නේ සාමාන්‍ය සිරුරකටයි. කිසිම ශාරීරික ජීවයක්, පරමාත්ම දෙවියන් ලෙස හැඳින්විය නොහැක. මනුෂ්‍යයින්ට වෙනත් මනුෂ්‍යයින්ට විමුක්තිය පිරිනැමිය නොහැක. විමුක්තිය පිරිනැමිය හැක්කේ ගුරුට පමණයි. මිනිසුන් 60 වන වියේ, විශ්‍රාමික තත්ත්වයට ගිය විට, ඔවුන් ගුරු කෙනෙක් හදාගනී. එම ක්‍රම වේදය මෙකල ආරම්භ වී, ඉන්පසුව භක්ති මාර්ගයේ දිගටම පැවතෙයි. මෙකල ඔවුන් කුඩා දරුවන්ටද ගුරුන් සොයා දෙයි. ඔවුන්ගේ විශ්‍රාමික තත්ත්වයේ ඔවුන් නොසිටියත්, ඕනෑම කෙනෙකුට හදිසි මරණයක් සිදු විය හැක. කුඩා දරුවන්ටද ඔවුන් ගුරුනන් සොයා දෙන්නේ මේ නිසාය. ඔබ සෑම කෙනෙක්ම ජීවාත්ම බවත්, ඔබ සෑම කෙනෙකුටම ඔබගේ උරුමය හිමි කරගැනීමට අයිතියක් තිබෙන බව, පරමාත්ම පියා පවසන අන්දමින්ම, ඔවුන් කියන්නේ, ගුරු කෙනෙක් නොමැතිව ඔබට තත්ත්වයක් ලබා ගැනීමට නොහැකි බවයි, එනම්, ඔබට බ්‍රහම් පදාර්ථයට මුසු වීමට නොහැකි බවයි. ඔබට මුසු වීමට අවශ්‍ය නැත. එම ව්‍යවහාරය අයත් වන්නේ භක්ති මාර්ගයටයි. ජීවාත්මයක් කුඩා තරුවක් මෙනි, තිතක් පමණයි. පරම පියාද තිතකි. එම තිතට, ඥානයේ මහා සාගරය යැයි කියයි. ඔබද කුඩා ජීවාත්ම වන අතර, සියලුම ඥානය එම තිත තුළ පටිගත වී ඇත. ඔබ සම්පූර්ණ ඥානයම ලබා ගනී. ඔබ සම්මාන සහිතව සමත් වෙයි. ඔහු ශිව ලිංගමයක් මෙන් විශාල නැත. පරමාත්ම ජීවාත්මය, ජීවාත්මයක ප්‍රමාණයම ගනී. ජීවාත්මයක් තම චරිත කොටස රඟපෑම සඳහා, පරම නිවහනේ සිට පැමිණෙයි. පරම පියා පවසන්නේ මාද එහි සිට පැමිණෙන නමුත්, මට මගේම සිරුරක් නැත. මම රූප් මෙන්ම බසාන්ට්ද වෙමි. පරමාත්ම ජීවය රූප් වන අතර ඔහු සියලුම දැනුමින් පිරී සිටියි. මනුෂ්‍යයන්ට, පාපකාරී ජීවයන්ගෙන්, පුණ්‍ය ජීව බවට පරිවර්ථනය විය හැකි වන සේ, ඔහු ඥානය වස්සවයි. පරම පියා විමුක්තිය සහ ජීවන මුක්තිය යන දෙකම පිරිනමයි. ඔබ ජීවන මුක්තියට යන අතර, අන් සියලු දෙනා විමුක්තියට, එනම් ඔවුන්ගේ නිවසට යයි. එය මිහිරි නිවහනයි. මෙම දෙසවන් තුළින් සවන් දෙන්නේ ජීවාත්මයයි. පරමාත්ම පියා දැන් පවසන්නේ

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් නැතිව සිට දැන් හමු වූ දරුවනි, ඔබ දැන් ආපසු නිවසට යා යුතුයි. මේ සඳහා, ඔබ අනිවාර්යයෙන්ම පිවිතුරුව රැඳී සිටිය යුතුයි. පිවිතුරු ජීවාත්ම හැර වෙනත් කිසිවෙකුට ආපසු නිවසට යාමට නොහැක. මා පැමිණ සිටින්නේ සැම කෙනෙක්ම ආපසු ගෙන යාමටයි. ජීවාත්මයන්ට, ශිවාගේ පෙරහැර යැයි කියයි. ශිව බාබා, දැන් ශිව දේවාලය (ශිවාලය) ස්ථාපිත කරනවා. ඉන්පසුව රාවන පැමිණ, ගණිකා මඩම ස්ථාපිත කරයි. පාපයේ මාවතට, ගණිකා මඩම යැයි කියයි. විවාහයෙන් පසුවත් පාරිශ ශුද්ධව රැඳී සිටින බොහෝ දරුවන් බාබාට සිටියි. දෙදෙනාට ඒ අන්දමින් එකට වාසය කිරීම, සිදු කළ නොහැක්කක් බව, සන්යාසීන් කියයි. එහි බොහෝ ආදායමක් තිබෙන බව, මෙහිදි ඔබට විස්තර කර දෙනු ලබයි. පිවිතුරුව රැඳී සිටීමෙන්, ඔබ උපතත් 21 කට රාජධානියක් හිමි කරගනී. එබැවින් එක් උපතකට පිවිතුරුව සිටීම ලොකු දෙයක් නොවෙයි. පරම පියා පවසන්නේ ඔබ රාගයේ කොත මත අසුන් ගැනීමෙන් සම්පූර්ණයෙන්ම අවලස්සන වී ඇත. ක්‍රිෂ්ණා ගැන කියා තිබෙන්නේ, ඔහු අවලස්සන මෙන්ම ලස්සන බවයි, ශ්‍යාම් සහ සුන්දර්. මෙම විස්තර කිරීම මෙම කාලය ගැනයි. රාග කොත මත අසුන් ගැනීමෙන් ජීවය අවලස්සන වී ඇත. එවිට ඔහුට ගම්බද කොලුවෙක් යැයි කියයි. ඔහු සැබවින්ම එසේ විය. ක්‍රිෂ්ණාට එය විය නොහැක. ඔහු තුළට පරම පියා ඇතුළු වී, ඔහුව ලස්සන කරවන්නේ, ඔහුගේ බොහෝ උපත් වල අවසාන උපතේ අන්තිමේදීය. ඔබ දැන් සිහි කළ යුත්තේ එක් පියාව පමණයි. බාබා, ඔබ බොහෝ මිහිරියි! ඔබ අපිට බොහෝ සේ මිහිරි උරුමයක් ලබා දෙයි. ඔබ අපව, සාමාන්‍ය මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය කර, දේවාලයක සිටීමට සුදුස්සන් බවට අපව පත් කරවයි. මේ අන්දමින් තමාට කතාකරන්න. ඔබගේ මුවින් ඔබ කිසිවක් කිව යුතු නැහැ. ඔබ භක්ති මාර්ගයේදී බොහෝ සෙයින් ආදරවන්තයාව සිහි කරමින් සිටියා. ඔබ දැන් පැමිණ අපව මුණ ගැසී ඇත! බාබා, සියල්ලන්ට වඩා මිහිරි වන්නේ ඔබයි! අප ඔබව සිහි නොකර සිටින්නේ කුමටද? ඔබට සෙනෙහසේ මහා සයුර සහ සාමයේ මහා සයුර යැයි කියයි. අපට උරුමයක් ලබා දෙන්නේ ඔබ පමණයි සිතිවිලි මගින් දිරිමත් කිරීමෙන් කිසිවක් ලබා ගත නොහැක. පරම පියා පෞද්ගලිකවම මෙහි පැමිණ ඔය දරුවන්ට උගන්වයි. මෙය පාඨශාලාවකි. පරම පියා පවසන්නේ මා ඔබව රජවරුන්ගේත් රජවරුන් බවට පත් කරවනවා. මෙය රාජයෝගාවයි. ඔබ දැන් අශාරීරික ලෝකය, සූක්ෂම කලාපය සහ භෞතික ලෝකය මෙන්ම මෙතරම් කුඩා ජීවාත්මයක් ඔහුගේ චරිත කොටස රඟපාන අන්දම ගැනද දන්නවා. මෙය පෙර තීරණය වුණු නාටකයක්. මෙය සදාතනික, අවිනාශී ලෝක නාටකය ලෙස හැඳින්වෙයි. නාටකය අඛණ්ඩව භ්‍රමණය වෙයි මේ ගැන සැකයක් ඇති කිරීම ගැන ප්‍රශ්නයක් නැත. පරම පියා ඔබට ලෝකයේ මුල, මැද සහ අවසානය පිළිබඳ රහස් කියයි. ඔබ ස්වදර්ශනචක්‍රධාරීන්ය. මුළු චක්‍රයම ඔබගේ බුද්ධිය තුළ භ්‍රමණය වෙයි, එබැවින් එමගින් ඔබගේ පාපයන් කැපී යයි. කෙසේවෙතත්, ක්‍රිෂ්ණා චක්‍රය භ්‍රමණය කර කිසිම හිංසනයක් සිදු කළේ නැත. එහි යුධ හිංසන හෝ රාගයේ අසිපතවත් නොමැත. එහිදී ඔවුන් දෙගුණයක් අවිහිංසාවාදීන්ය. මෙකල ඔබගේ යුද්ධය තිබෙන්නේ පාපයන් පහ සමගයි. එය වෙනත් යුද්ධයක් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. පරම පියා උසස්ම උසස් වන අතර ඔහු ඔබව ලක්ෂ්මී සහ නාරායන් මෙන් උසස් බවට පත් කරවන, උසස්ම උසස් උරුමය ලබා දෙයි. ඔබ වැඩියෙන් උත්සාහ දරන තරමට, ඔබ හිමි කරගන්නා තත්ත්වයද උසස් වෙයි. සැම චක්‍රයකදීම එය ඔබට එම ඉගෙනුමම වෙයි. ඔබ දැන් හොඳින් උත්සාහ දරන්නේ නම්, ඔබ එය දිගින් දිගටම චක්‍රයෙන් චක්‍රයට කරනු ඇත. ඔබට මෙම ආධ්‍යාත්මික ඉගෙනුමෙන් මෙන් උසස් තත්ත්වයක් භෞතික ඉගෙනුමකින් ලබා ගත නොහැක. ලක්ෂ්මී සහ නාරායන් උසස්ම උසස් අය බවට පත්වෙයි. ඔවුන්ද මනුෂ්‍යයින් වන නමුත් ඔවුන් දිව්‍යමය ගුණධර්ම ධාරණය කළ නිසා, ඔවුන්ට දේවතාවන් යැයි කියයි. කෙසේවෙතත්, අත් අටක් හෝ දහයක් තිබෙන මනුෂ්‍යයන් නොමැත. භක්ති මාර්ගයේ ඔවුන්ට දර්ශනයක් ලැබුණු විට ඔවුන් බොහෝ හඬයි. ඔවුන් දුකට පත්වී බොහෝ කඳුළු සලති. මෙහිදී බාබා පවසන්නේ ඔබ කඳුළු සලන්නේ නම් ඔබ අසමත් වෙයි. ඔබගේ මව මිය ගියත්, හල්වා කන්න. මෙකල බොම්බායේ වුවද කෙනෙක් මිය ගිය විට, පැමිණ ඔවුන්ට සාමය ලබා දෙන්නට කියා ඔවුන් බ්‍රහ්මකුමාරීන්ට කියයි. ඔබ ඔවුන්ට විස්තර කරන්නේ ජීවාත්මය, එක් සිරුරක් හලා, තවත් එකක් ගෙන ඇත, ඉතිං ඔබ ඉන් තැවෙන්නේ ඇයි? ඇඬීමෙන් ඇති ඵලය කුමක්ද? ඔවුන් පවසන්නේ මරණය විසින් ඔහුව රැගෙන යනු ලැබුවා. එවන් දෙයක් නැත. ජීවාත්මය ඉබේටම ඔහුගේ සිරුර හලා දමයි. ජීවාත්මය ඔහුගේ වෙලාවේදී සිරුර හලා, දිව යයි. කෙසේවෙතත්, මරණය කියා දෙයක් නැත. ස්වර්ණමය යුගයේදී මච්කුස මාලිගාවක් වැනිය දඬුවම් ලැබීම ගැන ප්‍රශ්නයක් නැත. එහිදී ඔබගේ ක්‍රියා අකර්මයි. එහි මායා නොමැති නිසා, එහිදී පාපකර්ම සිදුකරන්නේ නැත. ඔබ පාපකර්ම ජයගන්නා අය බවට පත්වනවා. පළමුවෙන්ම පාපකර්ම ජයගත් අයගේ සමය තිබේ. ඉන්පසුව භක්ති මාර්ගය ආරම්භ වී, වික්‍රම රජුගේ පාලනය තිබෙයි. (විකර්ම = පාපකර්ම). මෙකල ඔබ සිදු කර ඇති පාප කර්ම ජය ගනී. දී ඇති නම වන්නේ ‘පාප කර්ම ජයගන්නා’ (විකර්මජීත් පාපකර්ම ජයගත්

තැනැත්තා). ඉන්පසුව තඹ යුගයේදී වික්‍රම රජු සිටියි පාපයන් දිගටම සිදුවෙයි. ඉඳිකටුවක මළකඩ තිබේ නම්, කාන්දමකට එය ඇද ගැනීමට නොහැකි වෙයි. පාපයේ මළකඩ, වැඩියෙන් ඉවත් කරන තරමට, කාන්දමට ඉඳිකටුව වැඩියෙන් ඇද ගැනීමට හැකි වෙයි. පරම පියා සම්පූර්ණයෙන්ම පාරිශ ශුද්ධයි. යෝගා බලයෙන් ඔහු ඔබවත් පිවිතුරු කරවයි. භෞතික පියෙක්, ඔහුගේ දරුවන් දැකීමට සතුටු වෙයි. අසීමිත පියාද, දරුවන් සිදුකරන සේවය දැකීමට සතුටු වෙයි. දරුවන් බොහෝ උත්සාහ දරයි. ඔබ සෑම විටෙකම සේවය කිරීමට සූදානමින් සිටිය යුතුයි. ඔය දරුවන් අපවිත්‍ර අයව පිවිතුරු කරවන, දේවමය මෙහෙයුමයි. ඔබ දැන් පරමාත්ම දෙවියන්ගේ දරුවන්ය අසීමිත පියා සහ ඔය සියලුම සහෝදර සහෝදරියන් සිටියි. වෙනත් නෑදෑකමක් නැත. විමුක්ති දේශයේ පියා සහ සහෝදරයන් වන ඔය ජීවාත්ම සිටියි. ඔබ ස්වර්ණමය යුගයට ගිය විට, එක් පුතෙක් සහ එක් දියණියක් පමණක් සිටියි. මෙහි බොහෝ නෑදෑකම් තිබේ මාමා, බාප්පා ආදිය. අශාරීරික ලෝකය, මිහිරි නිවහනයි, විමුක්ති දේශයයි. මනුෂ්‍යයින් ඒ සඳහා, යාගහෝම පවත්වා, තපස් ආදිය රකින නමුත්, කිසි කෙනෙකුට ආපසු නිවසට යාමට නොහැක. ඔවුන් දිගින් දිගටම බොහෝ ගොතන ලද කතා කියයි. සියල්ලන්ටම විමුක්තිය පිරිනමන්නා ඒකායන කෙනා හැර වෙනත් කිසිවෙක් නොවෙයි. ඔබ දැන් සිටින්නේ සංගම යුගයේය. මෙහි බොහෝ මනුෂ්‍යයින් සිටියි. ස්වර්ණමය යුගයේ සිටින්නේ ඉතා ටික දෙනයි. ස්ථාපනය සහ විනාශය තිබේ. දැන් අසංඛෙය ආගම් තිබෙන නිසා, බොහෝ කැලඹීම් තිබේ. ඔබ 100% සම්ෘද්ධිමත්ව සිටි අතර, උපත් 84 ක් ගැනීමෙන් 100% දුගී බවට පත්ව තිබේ. පරම පියා දැන් සෑම කෙනෙක්ම අවදි කිරීමට පැමිණ සිටියි. දැන් අවදි වන්න! ස්වර්ණමය යුගය පැමිණෙනවා! ඔබට උපත් 21 කට උරුමයක් ලබා දෙන්නේ සත්‍ය පියා පමණයි. සත්‍ය දේශය වන්නේ භාරතය පමණයි. පරමාත්ම පියා සත්‍ය දේශය නිර්මාණය කරයි ඉන්පසුව අසත්‍ය දේශය නිර්මාණය කරන්නේ කවුද? පාපයන් පහ වන රාවනයි. ඔවුන් රාවනගේ විශාල පඹයෙක් සාදා එය පුළුස්සා දමන්නේ, අංක එකේ සතුරා ඔහු නිසාය. රාවනගේ රාජධානිය ආරම්භ වූයේ කෙදිනකද කියා මිනිසුන් නොදනී. පරම පියා විස්තර කරන්නේ චක්‍රයෙන් භාගයක් රාමාගේ රාජධානිය තිබෙන අතර ඉතිරි භාගයේදී රාවනගේ රාජධානිය තිබේ. කෙසේවෙතත්, රාවන යනු මරණයට පත්කළ යුතු මනුෂ්‍යයෙක් නොවෙයි. මෙකල, මුළු ලෝකය පුරාම එය රාවනගේ රාජධානියයි. පරම පියා පැමිණ රාමාගේ රාජධානිය ස්ථාපිත කරන අතර, ඉන්පසුව ජයග්‍රහණයේ හඬ ඇසෙයි. එහි ඔවුන්ට නිරන්තර සතුට තිබේ. එය සතුටේ දේශයයි. මෙයට වඩාත්ම ශ්‍රේෂ්ඨ සංගම යුගය යැයි කියයි. පරම පියා පවසන්නේ ඔබ මෙම උත්සාහය දැරීමෙන් මෙය බවට පත්වෙයි. ඔබගේ ඡායාරූප ගන්නා ලදී. බොහෝ දෙනෙක් පැමිණි අතර, මෙම ඥානයට සවන් දී, ඉන්පසුව එය වෙනත් අයටත් පැවසීමෙන් පසුව, ඔවුන් පැන ගියා. පරම පියා පැමිණ බොහෝ සෙනෙහසින් යුතුව, ඔය දරුවන්ට විස්තර කරදෙයි. පියා සහ ගුරුවරයා ඔබට සෙනෙහස දක්වයි ගුරුද ඔබට සෙනෙහස පායි. සත්ගුරුට අපහාස කරන කෙනෙකුට උසස් තත්ත්වයක් හිමි කර ගත නොහැක. ඔබගේ අරමුණ සහ ඉලක්කය ඔබ ඉදිරියේ ඇත. එම ගුරුන්ට කිසි අරමුණක් හෝ ඉලක්කයක් නැත. එය අධ්‍යයනයක් නොවෙයි මෙය අධ්‍යයනයකි. මෙය, ඔබ සදා නිරෝගී සහ ධනවත් වන, විශ්ව විද්‍යාලයක් හා රෝහලකි. මෙහි (කලියුගයේ) සෑම දෙයක්ම අසත්‍යයි. ඔවුන් ගයන්නේ මායා බොරුවක්, සිරුර බොරුවක් සහ මුළු ලොවම බොරුවකි. ස්වර්ණමය යුගය, සත්‍ය දේශයයි. එහි දියමන්ති සහ මැණික් එබ්බවූ මාලිගා තිබේ. සෝම්නාථ දේවාලය, භක්ති මාර්ගයේ නිර්මාණය කරන ලදි. එහි බොහෝ ධනය තිබුණි මුස්ලිම්වරුන් පැමිණ එය කොල්ලකා, විශාල පල්ලි සෑදීමට එය භාවිත කළා. පරම පියා ඔබට අසීමිත නිධන් ලබා දෙනවා. ඔබට ආරම්භයේ සිටම ඒවායේ දර්ශන ලැබෙමින් තිබුණා. බාබා, අල්ලා අවල්ඩීන්ය (අවල් = ප්‍රථම, ඩීන් = ආගම). ඔහු දේවතා ධර්මය වන ප්‍රථම ආගම ස්ථාපිත කරයි. නොපවතින ආගම, නැවත වරක් ස්ථාපිත කෙරෙනවා. පෞරාණික ස්වර්ණමය යුගයෙදී, එය ඔවුන්ගේ රාජධානිය වූ බව, සෑම කෙනෙක්ම දන්නවා. ඔවුන්ට වඩා උසස් කෙනෙක් නොමැත. දේවතා රාජධානියට, පාරාදීසිය යැයි කියයි. ඔබ දැන් මෙය දන්නා අතර, ඉන්පසුව ඔබ අන් අයට එය පැවසිය යුතුයි. ඔවුන් දැන නොසිටි බව පැමිණිලි නොකරන අන්දමින්, සෑම කෙනෙක්ම දැනුවත් වන්නේ කෙසේද? ඔබ සෑම කෙනෙකුටම පවසන නමුත් සමහරුන් පියා අතහැර ඉවත්ව යයි. මෙම ඉතිහාසය නැවත සිදු විය යුතුයි. ඔබ බාබා වෙතට පැමිණෙන විට, බාබා ඔබගෙන් මෙසේ විමසයි අප මින් පෙර මුණගැසී තිබේද? ඔබ පවසන්නේ ඔව්, බාබා අපි වසර 5000 කට පෙර ඔබව මුණගැසීමට පැමිණියා. අපි අපගේ අසීමිත උරුමය හිමි කර ගැනීමට පැමිණියා. සමහරු පැමිණ මෙයට සවන් දෙන අතර සමහරුන්ට බ්‍රහ්මාගේ දර්ශනයක් ලැබුණු විට, මේ සෑම දෙයක්ම මතකයට නැඟෙයි. එම ස්වරූපයම ඔවුන් පෙර දැක ඇති බව ඔවුන් එවිට පවසයි. දරුවන් දැකීමට පියාද සතුටු වෙයි. අවිනාශී ඥානයේ මිණි මුතු වලින් ඔබගේ පසුම්බි පිරෙනවා. මෙය අධ්‍යයනයකි. ඔබට දින හතේ පාඨමාලාව ගෙන, ඔබ සිටින ඕනෑම තැනක, මුරලියට අනුව දිගටම ඉදිරියට යා හැක. දින හතකදී ඔබට බොහෝ දේ විස්තර කෙරෙන බැවින්, ඔබට

මුරලිය වටහාගැනීමට හැකි වෙයි. පරම පියා සියලුම රහස් ඔය දරුවන්ට ඉතා පැහැදිලිව අඛණ්ඩව විස්තර කරයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ස්වදර්ශන චක්‍රය බ්‍රමණය කර, ඔබගේ පාපයන් පුළුස්සා දමන්න. මෙම ආධ්‍යාත්මික ඉගෙනුම හදාරා, ඔබගේ තත්ත්වය උසස් කරගන්න. කිසිම හේතුවක් නිසා කඳුළු නොසලන්න.
2. මෙය විශ්‍රාමික තත්ත්වයේ සිටිය යුතු කාලයයි. එබැවින් බොහෝ සරළව සහ සාමාන්‍ය ලෙස ජීවත් වන්න; වැඩිය උසස් හෝ පහත් ලෙස ද නොවී. ආපසු නිවහනට යාමට, ජීවාත්මය සම්පූර්ණයෙන් පිවිතුරු විය යුතුයි.

**වරදානය:** සේවයට සහ ඔබේ සම්බන්ධතා වලට අනුව නිරන්තරයෙන් ඔබව හැඩගස්වා ගැනීමේ විශේෂත්වය තුළින් ඔබ සාර්ථකත්වයේ ප්‍රතිමූර්තියක් වේවා.

තමන්ව හැඩගස්වා ගැනීමේ විශේෂත්වය ඇති දරුවන් පහසුවෙන් ස්වර්ණමය යුගයට ළඟා වේ. ඔබේ ධාරණාව හෙළි කිරීමට නම්, කාලය හා තත්ත්වයන් අනුව ඔබව හැඩගස්වා ගත යුතුය. තමන්ව හැඩගස්වා ගන්නා අය පමණක් සැබෑ රත්තරන් ය. ඔබ සකාර් බාබාගේ විශේෂත්වය දුටුවේය: කාලය මෙන්ම, පුද්ගලයා ද, ඔහුගේ ස්වරූපය ද එසේම විය. ඒ ආකාරයෙන්ම පියාව අනුගමනය කරන්න, එවිට ඔබ කරන සේවයේ දී සහ ඔබේ සම්බන්ධතා තුළින් ඔබ පහසුවෙන් සාර්ථකත්වයේ ප්‍රතිමූර්තියක් වනු ඇත.

**පාඨය:** ඔබට සියලු බල තිබෙන කල, බාධක රහිත සාර්ථකත්වය ඔබ සමහයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

ශාරීරික ස්වරූපයෙන් සිටීම පහසු වී ඇති ආකාරයටම, ඔබ ජීවාත්ම ඔබේ කර්මතීත් අවධියේ සිටීම පුහුණු කළ යුතුය. එක් මොහොතක් ක්‍රියාවෙහි කර්ම යෝගීවරයෙකු වන්න, එම ක්‍රියාව අවසන් කළ වහාම, ඔබේ කර්මතීත් අවධියේ සිටින්න. එවිට මෙම අත්දැකීම පහසු වනු ඇත. සෑම විටම ඔබේ කර්මතීත් අවධියේ සිටීමේ ඉලක්කය තබා ගන්න. ක්‍රියාව සඳහා උපකරණයක් ලෙස කර්ම යෝගීවරයෙකු වී පසුව කර්මතීත් වන්න.